**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා එහි පරිපාලිතය - 2018**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ(මණ්ඩලය) සහ එහි පරිපාලිතය ඇතුළත් සමූහයෙහි ("සමූහය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ ප්‍රකාශන සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සහ එහි පරිපාලිතය ඇතුළත් සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත යටතේ සහ 1979 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධාන යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබෙද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 හි 5.5.15 ඡේද අනුව වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂය වන රු.175,527,953 හි පසුකාලීන මැනීම් සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය භාවිත කළ යුතු වුවත් එසේ කර නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ණයගැතියෝ අධි හෝ ඌණ ගණනය වී ඇති බව නිරීක්ෂණය විය. | සේවක ණය ලබා දී ඇත්තේ 8% පොලී අනුපාතයට වන අතර එය පැවති පොලී අනුපාතයන්ට සමානය. ඒ අනුව සඵල පොලී අනුපාතයක් ගණනය කිරීමෙක් අවශ්‍ය නොවනු ඇත. අනෙකුත් දිගු කාලීන ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් දැනටමත් අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර ඇත. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව වෙළඳ හා අනෙකුත් ණයගැතියන් පසුකාලීන මැනීම් සිදුකළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 යෙහි 34 ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණයන්හි සාධාරණ වටිනාකමෙහි සිදුවන වෙනස්වීම් මත පදනම්ව වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු අතර සාධාරණ වටිනාකම විශාල වශයෙන් වෙනස් නොවන අවස්ථාවන්හිදී අවම වශයෙන් වසර තුනක් හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද මණ්ඩලය සතු රු.2,845,805,495 වූ සියලු වත්කම් 2004 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා පිරිවැයක් දැරීමට සිදු වන අතර මණ්ඩලයේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතු කොට ගෙන එම පිරිවැය දැරීම අපහසු බැවින් එවැනි ප්‍රත්‍යාගණනයක් සිදු කර නොමැත. නමුත් මූල්‍ය තත්වය යහපත් වූ විගස ප්‍රත්‍යාගණනය කිරීමට බලාපොරොත්තු වේ. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව අනුව දේපළ පිරියත හා උපකරණයන්හි සාධාරණ වටිනාකමට දැක්විය යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16යෙහි 50 හා 51 ඡේද ප්‍රකාරව භාවිතයට ගනු ලබන වත්කම්වල ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය කර ඵලදායි ජීවකාලයක් ඇස්තමේන්තු කර ගිණුම්වල ඇස්තමේන්තු වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, ස්ථාවර වත්කම් ලේඛනයෙහි සඳහන් රු.254,755,187ක් වටිනා වතු උපකරණ, ගෘහ උපකරණ,මෝටර් වාහන, කාර්යාල | මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා පිරිවැයක් දැරීමට සිදු වන අතර මණ්ඩලයේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතු කොට ගෙන එම පිරිවැය දැරීම අපහසු බැවින් එවැනි ප්‍රත්‍යාගණනයක් සිදු කර නොමැත. නමුත් මූල්‍ය තත්වය යහපත් වූ විගස ප්‍රත්‍යාගණනය කිරීමට | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති වත්කම්වල ඵලදායී ජීවිත කාලය |

| | | |
|---|---|---|
| උපකරණ, යන්ත්‍ර උපකරණ හා ව්‍යුහයන් යන ඒවා සම්පූර්ණයෙන් ක්ෂය වී භාවිතයට ගනිමින් තිබුණද ප්‍රමිතය අනුව  ආයු කාලය සමාලෝචනය කර නොතිබුණි. | බලාපොරොත්තු වේ. | සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශවලට ගැලපුම් කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 යෙහි 6 ඡේදය ප්‍රකාරව බදු දී ඇති ඉඩම් , ආයෝජන දේපළ ලෙස ගිණුම්ගත කළ යුතු වුවද  වැලිසර හා මහබෙරියතැන්න ගොවිපොළවලට අයිති පුද්ගලික සමාගම් 02කට බදු දී ඇති ඉඩම් හෙක්ටයාර 206.87ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ප්‍රමිත අංක 40ට අනුව ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව ආයෝජන දේපළ ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 41හි 2 වන ඡේදයෙහි (ආ) වගන්තිය හා 4 වන වගන්තිය ප්‍රකාරව විෂය පථයට නොගැනෙන මණ්ඩලයේ පවතික ධාරක ජීව විද්‍යාත්මක වත්කම්  ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 යටතට අයත් වන අතර  එම වත්කම් හඳුනාගැනීම, මැනීම හා හෙළිදරව් කිරීම යනාදිය ඊට අනුකූලව සිදුකළ යුතු වුවද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.809,604,153ක් වූ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගිණුම්වල පවතින මෙවැනි දෑ නිවැරදි කිරීම සඳහා මේ වන විටත් සැලසුම් කර ඇති අතර  ඒ අනුව වත්කම් හඳුනාගෙන ඉදිරියේදී අදාල හෙළිදරව්කිරීම් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් හඳුනාගැනීම, මැනීම හා හෙළිදරව් කිරීම යනාදිය කළ යුතුය. |
| (ඊ)සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ පොල් හා ආශ්‍රිත නිෂ්පාදන මගින් ප්‍රවර්තන වර්ෂයේදී රු.7,687,939 ආදායමක් එනම් මුළු ආදායමින් සියයට 11.92ක දායකත්වයක් සමාගම වෙත ලබාදෙන නමුත් පොල් වගාවෙහි වටිනාකම පිරිවැයට හෝ සාධාරණ අගයට තක්සේරු කර මේරු වගාවක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 45 ඡේදය ප්‍රකාරව ගිණුම් ගත කර නොතිබීම නිසා ආයතනයේ ජංගම නොවන වත්කම්වල සාධාරණ තත්ත්වයක් පෙන්නුම් නොකරන බව නිරීක්ෂණය විය. | පොල් වගාව පිරිවැය හෝ සාධාරණ අගයට මූල්‍ය  ප්‍රකාශන තුළින් ඉදිරිපත් කිරීමට ඉදිරියේ දි කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව මේරු පොල්ගස් වල වටිනාකම පිරිවැය හෝ සාධාරණ අගයට තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් මහබෙරියතැන්න ගොවිපොළෙහි,වික්ටෝරියා කොටස හමුදාවට පවරා දීම වෙනුවෙන් රු.6,500,000ක ප්‍රතිෂ්ඨාවක් ලබාගෙන තිබුණද එම ඉඩමේ පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඊට අදාළ ලාභය හෝ අලාභය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණි. | 2018/12/20 දින මහබෙරියතැන්න ගොවිපලේ වික්ටෝරියා කොටස හමුදාවට පවරාදීම හේතුවෙන් රු.6,500,000ක අත්තිකාරම් මුදලක් ලැබී ඇති අතර  2019 වර්ෂයේ ඉතිරි මුදල් ලබාදී ගනුදෙනුව සම්පූර්ණ කර ඇත.ඒ අනුව අදාළ  ඉඩමේ සංවර්ධන පිරිවැය වන රු.46,804ක මුදල 2019 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී ඉවත් කර ඇත. | විකුණු ඉඩම ස්ථාවර වත්කම් වලින් ඉවත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)2016 වර්ෂයේදී මණ්ඩලය විසින් ප්‍රසාද දීමනා ගෙවීම වෙනුවෙන් රු.12,957,479ක් වෙන්කිරීම් කර ඉන් රු.5, 219,946ක් ගෙවා තිබුණු අතර ඉතිරි රු.7,737,533ක ශේෂය වෙන්කිරීම් යටතේ දක්වා තිබුණි. එම අධි වෙන් කිරීම 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරියට ගෙනවිත් තිබුණු අතර එය සමුච්චිත ලාභයට බැර කළ යුතුව තිබුණද එසේ සිදුකර නොතිබුණි. | 2019 වර්ෂයේ අදාළ වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසාද දීමනා අධි වෙන්කිරීම සමුච්චිත ලාභයට ගැලපිය යුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව කිරි ව්‍යාපෘතිය , ඕලයිට් ව්‍යාපෘතිය හා අලෙවිසැලේ සාමාන්‍ය තොග එකතුව රු.38,466,731ක් වුවද තොග සමීක්ෂණ වාර්තා අනුව මුළු තොග වටිනාකම රු.5,057,020ක් වුයෙන් රු.33,409,711ක වෙනසක් නිරීක්ෂණය විය. | කිරි ව්‍යාපෘතියේ රු.23,797,076ක නොසැසඳුණු තොග වටිනාකම භාණ්ඩ සමීක්ෂණ වාර්තාව තුළ ඇතුළත් කර නොමැති අතර සහ ජීවාණුහරණය කරන ලද දියරකිරි නිෂ්පාදනයන් වලට අදාළ අමුද්‍රව්‍ය තොග සියල්ල 2018 දෙසැම්බර් 31 වන විට ආයොජන කලාපයේ Tunip Lanka (Pvt) Ltd ආයතනය භාරයේ පැවති අතර වැලිසර ගොවිපළ තුළ අදාළ අමුද්‍රව්‍ය තොග නොතිබුණු බැවින්, 2018 වර්ෂයේ තොග සමීක්ෂණ කමිටුව විසින් 2018 වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තාවට එම ඕලයිට් නිෂ්පාදන අමුද්‍රව්‍යය ඇතුළත් කර නොමැත. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තොග ශේෂය නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) මණ්ඩලයේ ගොවිපොළවල් 04ක 2018 දෙසැම්බර් 31 දිනට තොග අයිතම 22ක පොත් ශේෂය හා භෞතික ශේෂය අතර රු.18,809,837ක වෙනසක් නිරීක්ෂණය විය. | විමසුමේ සඳහන් පරිදි ආඬිගම ගොවිපලේ තොග සමීක්ෂණ වාර්තාවට දත්ත ඇතුළත් කිරීමේදී විෂමතාවන් ඇතිව අත්වරදිකින් සටහන්ව ඇත.<br>බෙලිගම ගොවිපලේ පොල් තොගය සහ Timber stock;Mara Plank තොග අතපසුවීමකින් එය යතුරු ලියනය කිරීමට නොහැකි වී ඇත. මහබෙරියතැන්න ගොවිපලේ Coconut & Copra භෞතික තොග ශේෂයට වඩා අඩුවෙන් තිබූ අතර ඒවා අදාළ නිලධාරීන්ගෙන් අයකරගැනීමට කටයුතුකර ඇති අතර Coffee කිලෝග්‍රෑම් 05 ක් අඩුවෙන් තොග පොතට ගෙන ඇති අතර එය තොග සමීක්ෂණයෙන් පසු නිවැරදි කර ඇත.<br>මරදවිල ගොවිපලේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළියෙළ කිරීමේදී දත්ත පරිගණක ගත කිරීමේදී අතපසු වීමකින් විමසුමේ සඳහන් භෞතික ශේෂ සටහන් වී නොමැත. | භෞතික තොග ශේෂය පොත් ශේෂය සමග සසඳා නොසැසඳීම් සොයාබලා නිවැරදි කර ගිණුම් ගතකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ)මණ්ඩලය සතු ගොවිපොළවල්වල සැලකිය යුතු ප්‍රමාණයක පොල් ගස් සහ දැවමය වටිනාකමක් ඇති ගස් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර එලෙස ගිණුම්ගත නොකළ පොල් ගස් සහ තේක්ක ගස් විකිණීමෙන් රු.33,958,770ක ආදායමක් උපයා තිබුණි. | ගොවිපල වල වානිජ්‍ය වගාවක් ලෙස වගාකර ඇති සියලුම ගස් ගිණුම් වල නිරූපනය වන අතර ගොවිපළ තුළ කාලයක සිට පැවති ගස් හා ගොවිපලේ වැටඉණි ලෙස සිටවූ ගස් මෙන්ම ගොවිපලේ සේවකයන් විසින් විවිධ අවස්ථාවල ඔවුන්ගේ තම ශ්‍රමය භාවිතා කරමින් සිටුවා ඇති ගස් ගොවිපළ විසින් කළමනාකරණය නොකරන බැවින් වටිනාකම් ගිණුම් වල නිරූපනය නොකරනු ලැබේ.<br>පොල් ගස්වල වටිනාකම් නිවැරදිව හඳුනාගැනීමට හැකියාවක් මූල්‍ය අංශය සතු දත්ත වලින් සිදුකළ නොහැකි බැවින් මෙම ගැටලුව ඇති වී ඇත. | මණ්ඩලය සතු ගොවිපොළවල්වල පොල් ගස් සහ දැවමය වටිනාකමක් ඇති ගස් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) 2018 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ගවයින්/මී හරක් 13,327 ක් ද කුකුළන් 38,803ක් ද, බිත්තර දමන කිකිළියන් 9,554ක් ද බැටළුවන් 6,956ක් ද එළුවන් 990ක් ද හාවන් 208ක් ද වශයෙන් දක්වා තිබුණු අතර උපලේඛනය අනුව එය පිළිවෙලින් 13,100 ක් 26,638ක් 19,706 ක් 6,982 ක් 989ක් සහ 182ක් වූයෙන් සතුන්ගේ සංඛ්‍යාවෙහි 22,597ක වෙනසක් විය. තවද මාරවිල ගොවිපොළේ රු.397,445ක් වටිනා වානිජ ව්‍යාපෘති සහ බිත්තර දමන කිකිළියන් සංඛ්‍යාව දක්වා නොතිබුණු අතර මාටින් ගොවිපොළෙහි එළගවයන් 03 දෙනෙකුගේ වටිනාකම ද ඇතුළත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | භෞතික සමීක්ෂණ වාර්තා වල දැක්වෙන ශේෂ මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (උ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමෙන් ලැබිය යුතු ශේෂය රු.4,184,415ක් වන නමුත් සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ මූල්‍ය ප්‍රකාශනයෙහි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු ශේෂය රු.3,079,094කි. ඒ අනුව එම ශේෂ අතර රු.1,105,321ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස්කම් සොයා බලා නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සොයා බලා ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. | සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපරික සමාගමෙන් ලැබිය යුතු ශේෂයෙහි වෙනස්කම් සොයා බලා නිවැරදි කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඌ)කෙටිකාලීන ආයෝජන ස්ථාවර තැන්පතු 02 ක් සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු පොලී ආදායමේ එකතුව රු.1,937,062 ක් වුවත් එය රු.1,320,484ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබීමෙන් ලැබියයුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.616,578 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. එය 2019 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | කෙටිකාලීන ආයෝජන ස්ථාවර තැන්පතු සඳහා ලැබියයුතු පොලිය ආදායමේ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ)ඩයගම ගොවිපොළෙහි කිරි නිෂ්පාදනය සත්වයන්ගෙන් සත්වයන්ට වෙනවෙනම ගත යුතු වුවත් ටෙම්පර්ඩ් බ්‍රිඩ් හා ටෙම්පර්ඩ් හෙයිෆර්ස් යන සතුන් දෙවර්ගයෙහි දෛනික කිරි නිෂ්පාදනය ලීටර් 10ක් ලෙස සලකා රු.3,530,000ක් ආගණනයේදී එකතු කර තිබුණි. විගණන පරීක්ෂාවේදී කිරි ලීටර 10ට අඩු සතුන්ද සිටි බැවින් මූල්‍ය ප්‍රකාශනයෙහි දැක්වෙන සතුන්ගේ වටිනාකම අධිගණනය වී තිබුණි. | වරදක් සිදු වී ඇති බව පිළිගනිමි .ඒ අනුව ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | කිරි ගවයින් නිවැරදි ලෙස ආගණනය කර ගිණුම් ගතකළ යුතුය. |
| (ඒ) කොවුල්වැව,නිකවැරටිය,රිදියගම හා බෝපත්තලාව යන ගොවිපොළවල සතුන් 2,722ක් ආගණනයේදී එම සතුන්ගේ දෛනික සාමාන්‍ය කිරි නිෂ්පාදනය පිළිවෙලින් ලීටර් 7,4,15 හා ලීටර් 12 ලෙස සලකා රු.24,437,300ක වටිනාකමක් එකතු කර තිබුණි. එක් එක් කිරි ගවයාගේ සත්‍ය කිරි නිෂ්පාදනය වෙනුවට එලෙස සාමාන්‍ය අගය යොදා ගැනීම දෝෂ සහිත බැවින් මූල්‍ය ප්‍රකාශනයෙහි දැක්වෙන සතුන්ගේ වටිනාකම අධි හෝ ඌන ගණනය වී තිබුණි. | වරදක් සිදු වී ඇති බව පිළිගනිමි. ඒ අනුව ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | කිරි ගවයින් නිවැරදි ලෙස ආගණනය කර ගිණුම් ගතකළ යුතුය. |
| (ඔ) 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු. 4,506,601ක ලැබිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම සම්බන්ධයෙන් ගණනය කිරීමේ ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි . | දේශීය අදායම් බදු දෙපාර්තමේන්තුව සමග සාකච්චාකර එවැනි බදු මුදලක් ගෙවීමට නොමැති නම් අදාල අනුමැතිය සහිතව ලියා හැරීමට කටයුතු කරමි. | විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදිය යුතුය. |
| (ඕ) 2018 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.203,014,385ක් වන අතර වසරකට වැඩි වෙළඳ සහ අනෙකුත් ණයගැතියන්ගේ ශේෂය රු.103,217,686ක් හා වසර 5ට වැඩි ශේෂය රු.57,811,745ක් විය. මෙම ණය ශේෂ අයකර ගැනිම අවිනිශ්චිත බව නිරීක්ෂණය කෙරේ. | වාර්ෂිකව වසර 5ට වැඩි සියලු ණයගැතියන් සඳහා 100% අඩමාණ ණය වෙන් කිරීමක්ද වසර 5ට අඩු ණයගැතියන් සඳහා කාලානුරූපව අඩමාණ ණය වෙන්කිරීමක් සිදු කරන බැවින් ණයගැතියන් අධිගණනය වීමක් සිදුවී නොමැත. | වෙළඳ සහ අනෙකුත් ණයගැතියන්ගේ ශේෂයන් කාලීනව අය කර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ක) සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.3,476,588ක් වටිනා කිකිළියන් 4,398 ක් අගය කොට එම කිකිළියන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබුණු ප්‍රාග්ධනිත කළ යුතු රු.3,872,164ක ආහාර හා ඖෂධ පිරිවැය ද අවසාන තොගයට එකතු කොට නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය හා තොගය රු.7,348,752ක ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරමි. | අවසාන තොගයට නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)2018 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පොල් තැරැව්කරුවන්ගේ ලැබිය යුතු දඩ මුදල් ශේෂය රු.21,171,911කි. ඉන් වසර පහකට වැඩි ශේෂය රුපියල් 7,315,492ක් වූ අතර එය මුළු ලැබිය යුතු ශේෂයෙන් සියයට 34 කි. මණ්ඩලය විසින් එම ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම තැරැව්කරුවන්ටම අඛණ්ඩව පොල් විකිණීම සිදුකර තිබුණි. | අවුරුදු 5 කට වැඩි ශේෂය වන රු.7,315,492 මුදලින් 2020.09.29 දී බේරුම්කාර සැසිය හරහා රු.3,652,886 අයකරවා ගෙන ඇත.W.T Wass සමාගමග හැර ඉහත සමාගම් තුන සහ G & J මැතිව්ස් සමාගම සමග පමණක් වර්තමානයේ ගනුදෙනු කරනු ලැබේ. | පොල් තැරැව්කරුවන් ගෙන් ලැබිය යුතු දඩ මුදල් ගිවිසුම් ප්‍රකාරව අයකර ගත යුතුය. |
| (ආ)වසර හතරක් ඉක්මවූ රු.32,650ක වටිනාකමින් යුතු උත්සව අත්තිකාරම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද වසර පහ ඉක්මවූ ගොවිපොළවල් හතරක නිලධාරීන්ගෙන් ලැබිය යුතු උත්සව අත්තිකාරම් වටිනාකම රු.278,813ක් විය. | තවදුරටත් උත්සව අත්තිකාරම් මුදලින් රු.8200 ක මුදලක් අයකළ යුතුය.<br>රු.278,813 මුදල උත්සව අත්තිකාරම් නොවන අතර කාර්යය මණ්ඩලය වෙත ලබාදුන් ණය වේ .<br>අයකරගත නොහැකි ණය මුදල් කපාහැරිමටත්, අනෙකුත් ණය මුදල් අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගැනීමටත් කටයුතු කරමින් පවතී. | උත්සව අත්තිකාරම් හා ණය මුදල් අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| (ඇ)2013 මැයි 13 වැනි දින ආනයනය කරන ලද එහෙත් මියගිය එළදෙනුන් සම්බන්ධයෙන් ලැබිය යුතු රක්ෂණ වන්දි ශේෂය වන රු.19,253,926ක් වෙළඳ සහ අනෙකුත් ණය ගැති ශේෂයෙහි පැවතුණ අතර ඊට අදාළ සතුන්ගේ අංකයන් ඉදිරිපත් කර නොතිබුණි. කිරි ව්‍යාපෘතිවලට අදාළ වසරකට වැඩි රු.663,343ක් හා වසර 2ට වැඩි රු.34,100ක ලැබිය යුතු ශේෂ අයකරගෙන නොතිබුණි. ප්‍රධාන කාර්යාලය, රොසිටා ගොවිපොළෙහි සහ කොට්ටුකච්චිය ගොවිපොළෙහි වසර 05කට වැඩි වටිනාකම රු.18,576,776ක් වූ ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වටිනාකම් මේ වන විටත් අයකර ගැනීමට නොහැකි ණය ලෙස හදුනාගෙන අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් සැදුම්ලත් කමිටුවක් මගින් පොත් වලින් ලියා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ලැබිය යුතු ශේෂ කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ)වසරකට වැඩි පෙර ගෙවීම වටිනාකම රු.421,649 ක් වූ අතර වසර පහ ඉක්මවූ පෙර ගෙවීම් වටිනාකම රු.2,032,449 ක් වූ අතර එය ලැබිය යුතු මුළු පෙර ගෙවීමෙන් සියයට 27 ක් විය. | වසර 5 ට වැඩි පෙරගෙවීම් වල වැඩිම වටිනාකමක් සඳහන් වනුයේ හාරගම ගොවිපලේ උසාවි සතුන් නඩත්තු කිරීම සඳහා දරණ ලැබූ වියදම් වන අතර එම වටිනාකම රු.1,852,218කි. මෙම වටිනාකම විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම වෙත යොමු කර ආදායම් ප්‍රකාශයට ගැනිමට කටයුතු කරනු ලබයි. | පෙර ගෙවීම කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | වසරේ 1 සිට වසර 02 අතර පෙර ගෙවුම් වටිනාකම් අදාළ කාර්යය නිම වීමෙන් පසු ගිණුම්වලින් පියවී ඇත. | |
| (ඉ)වසර 5 ඉක්මවූ ගොවිපොළ කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු රු.1,099,070 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසර 5 වැඩි අයකරගත නොහැකි ණය ලියාහැරීම සඳහා මේ වන විටත් කටයුතු කරමින් පවතින අතර ඉතිරි ණය සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි. | කාර්ය මණ්ඩලයෙන් ලැබිය ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ප්‍රධාන කාර්යාලයේ මුළු ණයහිමි ශේෂය රු.79,636,722ක් වූ අතර ඉන් රු.34,421,296 ක් එනම් සියයට 43ක් ම වසර 5 ඉක්මවා තිබුණු අතර මණ්ඩලය විසින් නිරවුල් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් සැදුම්ලත් කමිටුවක් මගින් පොත් වලින් ලියා හැරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ණයහිමි ශේෂය නිරවුල් කර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ)නිරවුල් නොකළ ආපසු ගෙවිය යුතු වසරකට වැඩි තැන්පතු වටිනාකම රු.436,649 ක් වූ අතර වසර පහ ඉක්මවූ තැන්පතු වටිනාකම රු.1, 014.501 ක් වූයෙන් එය ගෙවිය යුතු මුළු තැන්පතුවෙන් සියයට 68 ක් විය. | මෙම තැන්පතුවලින් කොටස් ආරක්ෂිත තැන්පතු ලෙස තවමත් භාවිතා කරන අතර ඉතිරි වටිනාකම ලේඛන අනුව නිරවුල් කිරිමේ හැකියාවක් තිබේද යන්න සොයා බැලීමට ඉදිරියේ දී කටයුතු කරමි. | ආපසු ගෙවිය යුතු තැන්පතු නිරවුල් කර ගැනිමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)අංක පීඊඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව විචලනයන් පවතින විට එම විචලනයන් නිවැරදි කර යාවත්කාලීන කරන ලද අනුමත සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වුවද 2018 වර්ෂයේ අයවැයගත ආදායම හා වියදමෙහි ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූ නමුත් මණ්ඩලය විසින් ඒ අනුව උක්ත සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර ඉදිරිපත්කර නොතිබුණි. | අයවැය ගත අදායමේ හා වියදමේ විචලනයන් පදනම් කරගෙන සංයුක්ත සැලැස්ම යාවත්කාලින කිරිම 2021 වර්ෂයේ සිට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 5.1.2 වගන්තිය ප්‍රකාරව 2016-2020 සංයුක්ත සැලැස්මෙහි ආයතනය සතුව පවතින නිෂ්පාදන සහ මෙහෙයුම් පහසුකම්, මානව සම්පත හා කළමනාකරණ කුසලතා,තාක්ෂණික දැනුම, වෙළඳපොළවල් හා සැපයුම්කරුවන් ,සංවිධාන ව්‍යුහය , සැලසුම් කාල සීමාව | 2021-2025 සංයුක්ත සැලැස්ම කි සැකසීමේදී රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| තුළ ඉටුකළ යුතු ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කළමනාකරණ වගකීම , මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතින් සම්බන්ධව තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්මට ඇතුළත් විය යුතු කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරණු ලැබේ. | |
| (iii) 5.1.3 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව,මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් 2016 - 2020 සංයුක්ත සැලැස්ම 2016 ඔක්තෝබර් 27 දින අනුමත කර 2017 ජූලි 12 දින ප්‍රමාදව ඉදිරිපත් කර තිබුණි. | සංයුක්ත සැලැස්ම පිළියෙළ කිරීමේ දී යම් ප්‍රමාදයක් ඇති විය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) 5.2.2.(අ) වගන්තිය ප්‍රකාරව B ශ්‍රේණියට අයත් ආයතනයක් ප්‍රාග්ධන ආයෝජනය රු.මිලියන 2.5 ට වඩා සිදුවන ව්‍යාපෘති සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතු අතර මණ්ඩලය එම ශ්‍රේණියට අයත් වුවද රු. මිලියන 3.3 ක් වූ තෘණ වගාකිරිමේ ව්‍යාපෘතිය සඳහා එලෙස ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. | එකඟවෙමි. | චක්‍රලේඛයේ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (v) 5.2.4 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය ආරම්භවීමට තෙමසකට පෙර කෙටුම්පත් අයවැය අනුමැතිය ලබාදීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලය විසින් අයවැය අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත්තේ 2018 පෙබරවාරි 21 දිනය. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (vi) 5.2.5 වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර අදාළ මූල්‍ය වර්ෂය ආරම්භවීමට දින 15කට නොඅඩු කාලයක් තුළ අයවැය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත් 2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2018 පෙබරවාරි 27 දින වන අතර විගණනයට ඉදිරිපත් කරනු ලැබුවේ 2019 මැයි 21 වන දිනදීය. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (vii) 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2022 මාර්තු 22 දින ඉදිරිපත් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (viii) 7.4.1 වගන්තිය ප්‍රකාරව සෑම කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදු කළ යුතු වුවද, 2018 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ)අංක 01/2014 හා 2014 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 (2) ඡේදය | අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් විය යුතු වැලිසර ගොවිපොළ , ඩිලයිට් ව්‍යාපාතිය , වරලත් අලෙවිසැල් යන අංශවල ක්‍රියාකාරිත්වය හා වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් වියයුතු මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ණය ආපසු ගෙවීමේ සැලැස්ම, යාවත්කාලින කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය,අනුමත කාර්යය මණ්ඩලය සහ තත්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් වී නොතිබුණි. | 2019 වසරේ ක්‍රියාකාරි සැලැස්ම සහ අලෙවි සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. මෙයට අමතරව විකුණුම් අයිතමයන් සහ අලෙවිසැල් අනුව අලෙවි සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ)අංක PED 1/2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.1 ඡේදය | සභාපතිවරයා රාජකාරි හා පුද්ගලික පාවිච්චිය සඳහා එක් නිල වාහනයක් පමණක් ලැබීමට හිමිකමක් ලැබුවද , 2017 ජනවාරි 01 දින සිට මැයි 13 දින දක්වා වාහන තුනක්ද 2018 මැයි 14 සිට මේ දක්වා වාහන හතරක් ද වන ලෙස සභාපති වරයා වෙනුවෙන් අනුයුක්ත කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ බදු පෙර මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,617,810,304ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු.427,887,159ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,189,923,145ක පාඩුවේ වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මූල්‍ය පිරිවැය වැඩිවිම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය, ක්ෂණික වත්කම් අනුපාතය, දළ ලාභ අනුපාතය පිළිවෙලින් 0.17ක් 0.11ක් සහ 19 වූ අතර පෙර වර්ෂයේ එම අනුපාතයන් පිළිවෙලින් 0.25 ක් 0.17 ක් සහ 27ක් විය. ඒ අනුව මෙම අනුපාතයන් හි පිරිහිමක් නිරීක්ෂණය වූ අතර ජංගම වත්කම් අනුපාතය, ක්ෂණික වත්කම් අනුපාතය දූර්වල මට්ටමක ඇති හෙයින් කාරක ප්‍රාග්ධන ගැටලුවකට මුහුණ පා ඇති බව නිරීක්ෂණය විය . තවද දළ ලාභ අනුපාතය අඩු විමට විකුණුම් ආදායම අඩුවිමට හේතු වි තිබුණි .

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලය විසින් 1974 හා 1992 යන වර්ෂවල සිට පවත්වාගෙන එන ලද ගොවිපොළවල් 24 කට අයත් ඉඩම්වල අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සහ රජය සතු වන අතර විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව , 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඒවායේ රු . 194,565,192ක් වටිනා ගොඩනැගිලි හා රු. 701,358,733 ක් වටිනා ව්‍යුහයන් ඉදිකර තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සහ ඉඩම් කොමසාරිස් ජනරාල් ගෙන් ඉල්ලීම් සිදුකර ඇත. | ඉඩම් අයිතිය පවරා ගත යුතුය. |
| (ආ)මණ්ඩලය විසින් අනෙකුත් අමාත්‍යාංශවලට අයත් වාහන 42ක්ද , කොවුල්වැව පුද්ගලික සමාගමට අයත් වාහන 01ක් ද, ඉඩම් ගොඩකිරීමේ කොමිසමට අයත් වාහන 02ක් ද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන 09ක් ද, ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමට අයත් වාහන 05ක් ද ලෙස වෙනත් ආයතන වලින් ලබාගත් වාහන ධාවනයේ යොදවාගෙන තිබුනද එම වාහනවල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වාහන වල ලියාපදිංචි හිමිකම මුදල් නොගෙවා මණ්ඩලය වෙත පවරා ගැනීමේ හැකියාව පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මගින් කරුණු විමසූ අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින්ද කරුණු විමසීම් කර ඇත. ශ්‍රී ලංකා කුකුළු පාලන පුද්ගලික සමාගම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අනුබද්ධිත සමාගමක්ව පැවති අතර මේ වන විට මණ්ඩලය සතු ගොවිපළකි. මෙම ආයතනය මගින්<br><br>මණ්ඩලයේ ගොවිපළ සුපරීක්ෂක කටයුතු සඳහා 253-4140, 253-4141 සහ CAC-7973 දරන වාහන පමණක් ලබාගෙන ඇත. | වෙනත් අමාත්‍යාංශවලට හා ආයතන වලට අයත් වාහනවල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)අංක අමප 15/0940/631/018-1 දරන 2015 ජූලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමට අයත් සියලුම සම්පත්, වත්කම්, කොටස් හා කළමනාකරණය අදාළ නීතිමය ක්‍රියාවලීන්ට යටත්ව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත්කරගත යුතු බවට දන්වා ඇත. නමුත් 2020 අගෝස්තු 25 දින දක්වා සමාගමෙහි කොටස් අයිතියෙන් සියයට 27ක් පමණක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත්කරගෙන තිබූ අතර සෙසු කොටස් අයිතිය මණ්ඩලයට පවරාගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාවලීන් අනුගමනය කිරීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමේ ප්‍රාග්ධන කොටස්වලින් සී/ස මහවැලි අධිකාරිය 45% ද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 27% ද නෙදර්ලන්ත සංවර්ධන මූල්‍ය සමාගම - කොටස් ප්‍රතිශතය 23% කුකුල් පාලන සාමාජික ගොවින් 5% වේ.<br>මෙම සමාගමේ ගොවිපොළ කටයුතු පවත්වාගෙන යන ඉඩම් මහවැලි අධිකාරිය සතුවේ.<br>සමාගමට විරුද්ධව බාහිර පාර්ශවයක් විසින් ණය මුදල් ලබා ගැනිම සඳහා නඩු පවරා ඇත. මෙම කරුණු හේතුවෙන් මෙම සමාගම විසුරුවා හැර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළක් ලෙස පවරා ගැනිමට නොහැකි වි ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සියලු කොටස් පවරාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ)සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා ඇති රු.2,785,767ක ක්ෂය වෙන්කිරීම හා දේපළ පිරියත සහ උපකරණවල ලියා හළ අගය වන රු.82,868,230ක ශේෂයන්හි නිරවද්‍යතාවය විගණනයේදී සත්‍යුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යැමට ඉදිරියේදි කටයුතු කරනු ලැබේ | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ඉ)පොල් ව්‍යාපෘති ආදායම සැලකීමේදී ගොවිපොළ 05 ක පොල් ආදායම සංයුක්ත සැලැස්මෙන් අතහැර තිබුණු අතර වියදම සැලකීමේදී ගොවිපොළ 06ක වියදම සංයුක්ත සැලැස්මෙන් අතහැර තිබුණි. | පොළොන්තලාව ගොවිපොළෙහි ආදායම පොල් ව්‍යාපෘති යටතේද වැලිසර ගොවිපොළෙහි ආදායම සූකර ව්‍යාපෘති යටතේද සඳහන් කර ඇත. | සංයුක්ත සැලැස්මට සියලුම ගොවිපොළ ආදායම ඇතුළත් කළ යුතුය. |
| (ඊ)මණ්ඩලයේ පශු සම්පත් ව්‍යාපෘතියට අදාළව වියදම සඳහා ක්‍රියාකාරී සැලැස්මේ වෙන්කර ඇති වටිනාකමට වඩා අයවැය ලේඛනයේ, ගොවිපොළ 12ක එකතුව රු.72,147,214ක් වැඩියෙන් ද ගොවිපොළ 16 ක එකතුව රු.158,003,334ක් අඩුවෙන් ද දක්වා ඇති බව නිරීක්ෂණය විය | අදහස් දක්වා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ වියදම හා අයවැය ලේඛනයේ වියදම ගැලපිය යුතුය. |
| (උ)ගිණුම් අංශයෙහි සහකාර සාමාන්‍යාධිකාරී, කළමනාකරු හා සහකාර කළමනාකරු යන තනතුරු තුන 2017 වර්ෂයේ සිට ද සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන) තනතුර 2016 ජනවාරි මස සිට ද කළමනාකරු (මූල්‍ය) තනතුර 2016 ඔක්තෝම්බර් මස 25 දින සිට ද අධීක්ෂණ හා මෙහෙයුම් කළමනාකරු යන තනතුර 2016 සැප්තැම්බර් මස 03 දින සිට ද, සහකාර කළමනාකරු (මූල්‍ය) තනතුර 2015 දෙසැම්බර් මස 01 දින සිට ද, අධීක්ෂණ හා මෙහෙයුම් සහකාර කළමනාකාර තනතුරු 2011 අගෝස්තු මස 25 දින සිට ද පුරප්පාඩු වී පැවතුණ මුත් එම තනතුරු පිරවීමට ක්‍රියාකර නොතිබුණි. | සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය)<br>අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමෙන් පසු බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.<br><br>කළමනාකාර (මූල්‍ය)<br>ඒ සඳහා පුරප්පාඩුවට නිලධාරියෙකු සේවයේ යෙදී ඇත.<br><br>සහකාර කළමනාකාර (මූල්‍ය)<br>2018.10.01 වන දින තනතුරේ පුරප්පාඩු පුරවා ඇත.<br><br>සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)<br>එම තනතුරේ පුරප්පාඩුව පුරවා ඇත.<br>අපගේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව කළමනාකාර (අධීක්ෂණ හා මෙහෙයුම්) තනතුරේ පුරප්පාඩුව සඳහා බඳවා ගත නොහැකි අතර, සහකාර කළමනාකාර (අධීක්ෂණ හා මෙහෙයුම්) තනතුරෙහි පුරප්පාඩුව මේ වන විට පුරවා ඇත. | පුරප්පාඩු වී පැවතුන තනතුරු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඎ)එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණද, ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණි. | මේ වන විට SCI (රාජ්‍ය ආයතනික අභිප්‍රාය ලේඛනය )මගින් මණ්ඩලයේ අපේක්ෂිත අරමුණු ඉලක්ක සහ දර්ශක හඳුනාගෙන ඇතුළත් කර ඇති අතර 2021- 2025 වර්ෂ සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම සඳහාද ඇතුළත් කර ඇත. | අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගත යුතුය. |
| (එ)1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ 31 දින වන විට ඉඩම් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 05ක් ද මණ්ඩලය විසින් බඩ ඉරිඟු විකුණුම් සඳහා රු.11,947,220ක මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයට එරෙහිව නඩුවක්ද යනාදී වශයෙන් නඩුකටයුතු විභාග වෙමින් තිබුණි. | 2018 වර්ෂයේ ඉඩම් සම්බන්ධ නඩු 05ක් අධිකරණයේ විභාග වෙමින් පැවති, කන්තලේ දිසා අධිකරණයේ ඇග්‍රෝ ට්‍රේඩින් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් සමාගමට විරුද්ධව පවරන ලද N/52/2012 නඩු තීන්දුව අනුව රු.11,974,220/= ක මුදලක් අය කර ගැනිමට තීන්දු කර ඇත. සමාගම අක්‍රීය නිසා අය කර ගැනිමේ හැකියාවක් නොමැත. | අයකර ගත යුතු මුදල් හා ගෙවිය යුතු මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය. නෛතික ක්‍රියාමාර්ග වලට යෑමේ අවස්ථා අවම කරගත යුතුය. |
| (ඒ)කන්තලේ උක්වගා භූමියේ පිහිටි අක්කර 1000ක ඉඩමෙහි නැගෙනහිර නවෝදය යටතේ චක්‍රීය අරමුදලක් මත ක්‍රියාත්මක වන බඩඉරිඟු වගා කිරීමේ ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම සඳහා 2007 ජූනි 28 දින මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 37.55ක් මණ්ඩලය වෙත ලබා දී තිබුණි.එම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් 2011 සැප්තැම්බර් 11 දින ඉඩම ආපසු කන්තලේ සීනි සමාගම වෙත පවරන ලද අවස්ථාවේ චක්‍රීය අරමුදලේ පැවති රුපියල් 17,549,342 ක මුදල මහා භාණ්ඩාගාරයට යැවිය යුතු බව 2007 ජූනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි දක්වා තිබුණද ඊට පටහැනිව රුපියල් 13,295,637ක මුදලක් 2011 වසරේ සිට රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. | මණ්ඩලයේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුකොටගෙන මෙම මුදල් ගෙවීමට හැකියාවක් ලැබී නොමැත.ඉදිරියේදී මෙය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ගෙවීමට කටයුතු කරමි. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඔ) ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව ආනයනික එළ ගව ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව දෙවන වර්ෂයේ සිට ලාභ ලබන බවත්, 4 වැනි වර්ෂයේ සිට ලාභය ක්‍රමයෙන් 10 වන වර්ෂය දක්වා වැඩි වන බවත් දක්වා තිබුණු නමුත් 2012 හා 2013 වර්ෂ වල දී ආනයන කළ එළ ගවයින් රඳවා සිටින මැණික්පාලම, ඩයගම හා බෝපත්තලාව යන ගොවිපොළවල් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා දිගින් දිගටම අලාභ ලබා ඇති අතර 2015 වර්ෂයේ දී ආනයන කළ එළගවයන් රඳවා සිටින රිදියාගම ගොවිපොළෙහි 2017 හා 2018 වර්ෂ වලදී ශුද්ධ අලාභය පිළිවෙලින් රු.මිලියන 8 ක් හා රු.මිලියන 165 ක් වී තිබුණි. ඒ අනුව එම ශක්‍යතා | මෙම සතුන් මෙරටට ගෙන්විමේදි ශක්‍යතා අධ්‍යයනයක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් සිදු කර නොමැත. | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යයන වාර්තා නිවැරදිව සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| අධ්‍යයන වාර්තා නිවැරදි නොවන බවත් ව්‍යාපෘතිය අසාර්ථක බවත් නිරීක්ෂණය විය. | | |
| (ඕ)1966 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මිලදී ගත් යතුරුපැදි 14 ක්,ත්‍රීරෝද රථ 04 ක්,මිට්ෂුබිෂි ඩබල් කැබ් 04 ක්,ට්‍රැක්ටර් 03 ක් සහ මිට්ෂුබිෂි පෙජරෝ 01 ක් ධාවනයට සුදුසු තත්වයේ නොපවතින බව නිරීක්ෂණය විය. එයින් දැනට ධාවනයෙන් ඉවත් කර ඇති යතුරු පැදි 14 ක් සහ ත්‍රීරෝද රථ 4ක් අපහරණය කිරීමටත් ට්‍රැක්ටර් 2 ක් අලුත්වැඩියා කර ධාවනයේ යොදවා ගැනීමටත් පියවර ගෙන නොතිබුණි. | අංක 54-3419, 54-3415, 51-1088 සහ 54-3420 දරන මිට්සුබිෂි L 200 ඩබල් කැබ් රථ 04 සහ 32-0743 දරන මිට්සුබිෂි පෙජරෝ ජීප් රථය චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කර ඇති අතර යතුරුපැදි 14 ලියාපදිංචි හිමිකම නිරවුල් කර ගැනීමෙන් පසු ත්‍රීරෝද රථ 04ද සමඟ අපහරණය කිරීමට කටයුතු කරන අතර ට්‍රැක්ටර් තුන අලුත්වැඩියාකර ධාවනයේ යෙදවීමට තීරණය කර ඇති අතර, 37-6865 දරන ට්‍රැක්ටර් රථය මේ වනවිට අලුත්වැඩියා කර ධාවනයට යොදා ඇත. | මණ්ඩලය සතු වාහන ඵලදායි ලෙස භාවිතයට ගත යුතුය. |
| (ක)ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9:1 උපවගන්තිය ප්‍රකාරව විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වන අතර පීඊඩී/12 දරන 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 උප ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත හෝ අනියම් පදනම මත බඳවාගැනීමක් සඳහා හා ගෙවීම් කිරීමට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ පූර්ව අවසරය ලබා ගැනීම අනිවාර්ය වුවද එවැනි අනුමැතියකින් තොරව හිටපු සාමාන්‍යාධිකාරීවරයා විශ්‍රාම ගැන්වීමෙන් පසුව එනම් 2018 ජනවාරි මස 16 දින සිට 2019 ජනවාරි දක්වා එම තනතුරේ වැඩ බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර තිබුණි. | 2017 නොවැම්බර් මස 23 වන දින පුවත්පත් දැන්වීමක් මගින් හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් සාමාන්‍යාධිකාරි තනතුර සඳහා ඉල්ලුම්පත් කැඳවන ලද අතර, තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති එක් අයදුම්පත්‍රයක්වත් නොතිබු බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව එම තනතුරේ වැඩ බැලීමට එම අවස්ථාවේ හිටපු සාමාන්‍යාධිකාරී මහතා වෙත වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීමක් ලබාදී ඇත.<br>ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පිහිටුවන ලද 1972 අංක 11 දරන කෘෂිකාර්මික රාජ්‍ය සංස්ථා පනතේ 5.2.(b) වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇති බලතල අනුව කොන්ත්‍රාත් පදනම මත බඳවාගන්නා ලද සාමාන්‍යාධිකාරීවරයාගේ කොන්ත්‍රාත් දීමනාව තීරණය කර ලබාදී ඇත. | ආයතන සංග්‍රහය සහ අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |
| (ග) 2016 ජනවාරි මස 31 දින වැඩ තහනමට ලක් වූ නියොජ්‍ය සාමාන්‍යාධිකාරී (සංස්ථා හා මෙහෙයුම්) 2017 දෙසැම්බර් මස 12 දින සිට නැවත සේවයේ පිහිටුවා තිබුණු අතර 2017 ඔක්තොබර් මස 17 වන දින සිට එම තනතුර සඳහා වැඩ බැලීමට පත්කළ නිලධාරියාගේ තනතුර අවලංගු කළ යුතු වුවත් එසේ සිදු නොකර වැඩ බලන දීමනාව ලෙස 2017 දෙසැම්බර් මස 12 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා රු. 54,000ක් ගෙවා තිබුණි. | නව ව්‍යාපෘති සඳහා අධීක්ෂණයට ක්ෂේත්‍රය සඳහා යොදවා සිටි වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ඉවත් නොකර සේවය සඳහා යොදවන ලදී.<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංස්ථා මෙහෙයුම්) තනතුර ප්‍රධාන කාර්යාලයේ තනතුරක් වන අතර, එම තනතුරේ රාජකාරී වගකීම ලෙස ක්ෂේත්‍ර කටයුතු වල නියැලීම පැවරී නොමැති බව දන්වමි. | වැඩ බලන දීමනාව ගෙවීම් කිරිමේදි නිති රීති අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)කරදගොල්ල ගොවිපොළෙහි තොග සමීක්ෂණ වාර්තාව අනුව සාමාන්‍ය තොගය තුළ රු.513,387ක් වටිනා සෙමින් නිකුත්වන තොග පවතින බව නිරීක්ෂණය විය. | සමහර අයිතමයන් ගොවිපොළෙහි අවශ්‍යතාවය මත මිලදීගෙන ඇති අතර එම අයිතම අවශ්‍ය පරිදි භාවිතයට ගනු ලබන බැවින් මෙමගින් මණ්ඩලයට කිසිදු අලාභයක් සිදු නොවේ. | සෙමින් නිකුත්වන තොග කල් ඉකුත් වීමට පෙර භාවිතයට ගත යුතුය. |
| (ආ)ගොවිපොළ ගිණුම් අනුව, ආනයනික එළගව ව්‍යාපෘතිය ක්‍රියාත්මක ගොවිපොළවල් 04 සැලකීමේදී එම ගොවිපොළවල සත්ව ආහාර වියදම කිරි ආදායමින් සියයට 69ක් වූ අතර අනෙකුත් එළගව ව්‍යාපෘති සහිත ගොවිපොළ 18ක සත්ව ආහාර වියදම කිරි ආදායමින් සියයට 47ක් විය. තවද මී ගව ව්‍යාපෘතිය ක්‍රියාත්මක ගොවිපොළ 04ක සත්ව ආහාර වියදම කිරි ආදායමින් සියයට 32ක් වී තිබුණි. ඒ අනුව ගව ආහාර සඳහා වූ වියදම පමණක් සැලකිමේ දී ආනයනික එළගව ව්‍යාපෘතිය, දේශිය හා දෙමුහුන් එළගව ව්‍යාපෘතිය , හා මී ගව ව්‍යාපෘතිය අතරින් මී ගව ව්‍යාපෘතිය වඩා ලාභදායි බව නිරීක්ෂණය වුවත් මී ගව ව්‍යාපෘතිය පිළිබඳ විශේෂ අවධානය යොමුකර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මණ්ඩලය වඩා ලාභදායි ව්‍යාපෘති සඳහා යොමුවිය යුතුය. |
| (ඇ) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ හා මහ බැංකු වාර්ෂික වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුළ රටෙහි සමස්ත කිරි නිෂ්පාදනය ලීටර 391,530,600ක් ද පොල් නිෂ්පාදනය ගෙඩි 2,623,000,000ක් ද කුකුල්ලු නිෂ්පාදනය සතුන් 24,277,830ක් ද වූ අතර එයින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය ලීටර 14,002,607ක් ද පොල් ගෙඩි නිෂ්පාදනය ගෙඩි 12,990,883ක්ද කුකුළු නිෂ්පාදනය සතුන් 3,070,823ක් ද පමණක් විය. ඒ අනුව ජාතික නිෂ්පාදනයට මණ්ඩලයේ දායකත්වය කිරි නිෂ්පාදනයෙන් සියයට 3.6ක්, පොල් ගෙඩි නිෂ්පාදනයෙන් සියයට 0.5ක් හා කුකුළු නිෂ්පාදනයෙන් සියයට 12.6ක්ද වශයෙන් ඉතා පහළ මට්ටමක පැවතුණි. | දැනට මණ්ඩලය සතු කිරි ගවයින් සංඛ්‍යාව පොල් ඉඩම් ප්‍රමාණය සහ අභිජනන කුකුළු සංඛ්‍යාවේ ධාරිතාව මත මණ්ඩලයේ සමස්ත දායකත්වය තීරණය වී ඇත. | මණ්ඩලයේ නිෂ්පාදනය අනුව ජාතික නිෂ්පාදනයට දායකත්වය ඉහළ නංවා ගත යුතුය. |
| (ඈ)කුකුළු ආහාර සඳහා වර්ෂයකට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළවල් 12කට මෙට්‍රික් ටොන් 2,319ක් ද , ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන ( පුද්ගලික) සමාගමට මෙට්‍රික් ටොන් 559.6 ක් ද, මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමට මෙට්‍රික් ටොන් 1,674.7ක් ද වන ලෙස එකතුව වර්ෂයකට මෙට්‍රික් ටොන් 4,553.3ක් සඳහා රු.මිලියන 248.77ක් පුද්ගලික ආයතන 3 කට ගෙවා තිබුණි . 2018 වර්ෂයේ දී මෙම වියදම එක් එක් ආයතන වල දළ ආදායමින් පිළිවෙලින් සියයට 39 ක්, 64 ක් හා 54 ක් විය. | කුකුළන් පාලනයේදි සත්ව ආහාර සඳහා 80%ක මුදලක් වැයවන අතර එ ඒ ගොවිපොළවල සිටින සතුන්ගේ වයස් බාණ්ඩ මෙන්ම සත්ව ප්‍රමාණය අනුව ආහාර මිලදි ගැනිම වෙනස් විය හැක. ඒ අනුව එම වසරේ එ ඒ ආයතන වල සිටි සතුන් ප්‍රමාණය, සතුන්ගේ වයස | කුකුළු ආහාර සඳහා මණ්ඩලය සතු යන්ත්‍ර භාවිතා කිරිම මගින් වියදම අඩු කර ගැනීම සඳහා ක්‍රියාකළ යුතුය. |

| | | |
|---|---|---|
| | වෙනස්විමෙන් ඉහත වියදම වාර්තා වි ඇත. | |
| (ඉ) ආනයනික ගවයන් සිටින ගොවිපොළ 04ක 2018 වර්ෂයේ දී සෘජු වියදම රු. මිලියන 1.068ක් වූ අතර එක් එක් ගොවිපොළෙන් සෘජු වියදම් දැරූ පසු දළ අලාභ එකතුව රු. මිලියන 133ක් හා රිදියාගම ගොවිපොළෙහි දළ ලාභය රු. මිලියන 5ක් ද වී තිබුණි. ඒ අනුව මෙම ගොවිපොළවල් සඳහා අවම වශයෙන් සෘජු වියදම් හෝ ආවරණය කර ගැනීමට නොහැකි තත්වයක් ඇති බව නිරීක්ෂණය කෙරේ. | රිදියගම ගොවිපල ආරම්භ කලදා සිට අද දක්වාම පාඩු ලැබීම් වලට පාත්‍ර වන ගොවිපොළක් වන අතර පාරිසරික තත්ව සමනය කිරිම සඳහා විශාල වියදමක් දරා එම සතුන්ගේ ගව ගාල්වල උෂ්ණත්වය පාලනය කිරිම වැනි කරුණු සිදු කිරිමේදි විදුලි බිල මෙන්ම සතුන්ගේ නඩත්තු කිරීම් සඳහා අනෙකුත් වියදම් සැලකීමේදි ආදායම් උපයා ගැනිමේ නොහැකි තත්වයක් වාර්තා වී ඇත. මෙම සතුන් මෙරටට ගෙන්විමේදි ශක්‍යතා අධ්‍යයනයක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් සිදු කර නොමැත. | මණ්ඩලයේ ආනයනික ගවයන් සිටින අලාභ ගොවිපොළ ලාභ ලබන තත්වයට ගෙන ඒමට කටයුතු කළ යුතුය. |
| (ඊ)2012/2013 හා 2015 වර්ෂවලදී රු.මිලියන 4462ක විදේශ ණය වැයකර ආනයනය කරන ලද කිරිගවයින් 4,495 ක් ඇතුළුව ගොවිපොළ 20 ක සිටින සියලුම කිරිගවයින්ගෙන් අපේක්ෂිත කිරි නිෂ්පාදනය 2016 වර්ෂයේදී කිරි ලීටර 24,745,729ක් ද 2017 වර්ෂයේ දී කිරි ලීටර 20,096,620ක් ද 2018 වර්ෂයේ දී කිරි ලීටර 20,031,372ක් විය. සත්‍ය කිරි නිෂ්පාදනය 2016 දී කිරි ලීටර 17,147,819 ද 2017 දී 14,368,585 ද 2018දී 14,002,607 විය. ඒඅනුව සත්‍ය කිරි නිෂ්පාදනය අපේක්ෂිත කිරි ප්‍රමාණයට වඩා සියයට 31ක් 28.5 හා 30 අඩු වී තිබුණි . ගොවිපොළ 04 ක් සම්බන්ධයෙන් 2017 හා 2018 වර්ෂවලදී ගව ආහාර වියදම කිරි ආදායමින් සියයට 68 ක් හා සියයට 69 ක් වී ඇති අතර කිරි ව්‍යාපෘතියේ සෘජු වියදම් අඩුකිරීමෙන් පසු අලාභය 2017 වර්ෂයේ දී රු.220,040,086ක් හා 2018 වර්ෂයේ දී රු.411,526,157ක් විය. | කාලගුණික තත්ත්වයන් ගේ බලපැම සහ වෙලඳපොළ තුළ ආහාර වියදම ඉහළ යැම හේතු වි තිබුණි . | කිරි නිෂ්පාදනය වැඩි කර ගැනිමටත් ව්‍යාපෘතියේ සෘජු වියදම් අඩු කර ගැනිමටත් කළ යුතුය. |
| (උ)පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපොළ 4 ක් සතුව දිනකට එක් වරකදී ගව ආහාර ටොන් 3.75ක් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර 4ක් වසර 01 සිට වසර 09 දක්වා කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | මේ වන විට හොරකැළේ වීරවිල, මිරිස්වත්ත, කරඳගොල්ල, කොට්ටුකච්චිය, ශ්‍රී ලංකා කුකුළු ව්‍යාපාර සමාගම , මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම. යන ස්ථාන වල ස්ථාපිත කර ඇති සත්ත්ව ආහාර ඇඹරුම්හල් තුළින් කුකුලන්, ගවයන් හා ඌරන් | ගව ආහාර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සඳහා සත්ත්ව ආහාරද ඛනිජ මිශ්‍රණයද නිෂ්පාදනය කරනු ලබයි. | |
| (ඌ)ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළ 3ක් සතුව කුකුළු ආහාර සකස් කිරීමේ යන්ත්‍ර 05ක් ද මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම සතුව යන්ත්‍ර 01ක් ද ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම සතුව යන්ත්‍ර 02ක් ද වශයෙන් වර්ෂයකට කුකුළු ආහාර මෙට්‍රික් ටොන් 30,960 ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතින නමුත් 2018 වර්ෂයේ අවසානය වන විට එම යන්ත්‍ර 8 වසර 01 සිට වසර 09 දක්වා කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | මේ වන විට හොරකැළේ වීරවිල, මිරිස්වත්ත, කරඳගොල්ල, කොට්ටුකච්චිය, ශ්‍රී ලංකා කුකුළු ව්‍යාපාර සමාගම , මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම. යන ස්තාන වල ස්ථාපිත කර ඇති සත්ත්ව ආහාර ඇඹරුම්හල් තුළින් කුකුලන්, ගවයන් හා ඌරන් සඳහා සත්ත්ව ආහාරද ඛනිජ මිශ්‍රණයද නිෂ්පාදනය කරනු ලබයි. | කුකුළු ආහාර නිෂ්පාදනය කළ හැකි යන්ත්‍ර භාවිතයට ගැනිමට කටයුතු කළ යුතුය. |
| (එ)ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සි/ස මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම හා සි/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන ( පුද්ගලික) සමාගම යන සමාගම් තුනට හෙක්ටයාර් 12,617.43ක භූමියක් අයත් අතර 2018 දෙසැම්බර් 31 වන විට එම භූමි ප්‍රමාණයෙන් එකතුව හෙක්ටයාර් 2,311.35ක් උපයෝජනය නොවී පැවතුණි. | පහත සඳහන් ඌණ උපයෝජිත ඉඩම් සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරිම සඳහා කෙටිකාලින බදු ගිවිසුම් මගින් ලබා දිමට කටයුතු කර ඇත.<br>2021 වසරේ බදු දී ඇති ඉඩම් ප්‍රමාණය පරසංගස්වැව, ඔයාමඩුව සහ වීරවිල, පිළිවෙලින් අක්කර 500,1000,200 වූ අතර 2022 වසරේ බදු දී ඇති ඉඩම් ප්‍රමාණය පරසංගස්වැව, ඔයාමඩුව, වීරවිල, කොට්ටුකච්චිය, නිකවැරටිය සහ මරඳවිල පිළිවෙලින් අක්කර 980, 826, 150, 150, 250, 100 විය. | ඌන උපයෝජිත ඉඩම් ඵලදායි ලෙස භාවිතයට ගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2017 මාර්තු 15 දිනැති පරිපූරක 33 න් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය අනුව මිලියන 100 ට වැඩි මිලදී ගැනීම් කැබිනට් මණ්ඩලය විසින් පත්කරණ ලද ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කළ යුතු වුවත් මණ්ඩලයට අදාළව | වර්ෂයකට කිහිප වතාවක් ගව ආහාර මිලදී ගන්නා අතර එම මිලදී ගන්නා අවස්ථාවේදී අදාළ ගව ආහාර වල මුළු වටිනාකම මිලි.100 නොඉක්මවන බැවින් මණ්ඩලීය ප්‍රසම්පාදන කමිටුව හරහා මිලදී ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

සමාලෝචිත වර්ෂයේ රු.794,241,795ක් වටිනා  ගව ආහාර මිලදී ගැනීම මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි.

(ආ)2018 වර්ෂයේ රිදියාගම, මැණික්පාලම හා මණ්ඩලයේ අනෙකුත් ගොවිපොළවල් 19 යට අදාළව ගව  ආහාර මිලදි ගැනිම් නියැදි පරික්ෂාවට අනුව පිළිවෙළින් රු.84,222,564ක්, රු.62,486,124ක් හා රු.335,447,092ක් පෞද්ගලික සැපයුම් කරුවන්ට ගෙවා ඇති අතර රසායන පොහොර මිලදී ගැනීම සඳහා රු.46,108,867ක් පෞද්ගලික සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි. මෙම ප්‍රසම්පාදන කටයුතු  සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | | |
|---|---|---|
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 අනුව වූ ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. | පොහොර මිලදී ගැනීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර ඉදිරියේදී 4.3 යටතේ මුලු පිරිවැය ඇස්තමේන්තුවක් සහ 4.2.2 සහ 4.2.3 යටතේ ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බවට දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ii)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.8.1 ප්‍රකාරව මණ්ඩලය විසින් ප්‍රසම්පාදනය සඳහා තෝරා නොගත් සැපයුම්කරුවන් සඳහා තෝරා නොගැනීමට හේතු සඳහන් කරමින් ලිපි නිකුත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ මුල සිට සිදුකරනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ප්‍රකාරව තෝරාගන්නා ලද සැපයුම්කරුවන් විසින් කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් කළ යුතු වුවද එසේ කාර්යයසාධන සුරක්ෂණ ලබාගැනිමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | සත්ව ආහාර මිලදී ගැනීම් කෙටිකාලීනව සිදුකරන බැවිනුත් සත්ව ආහාර සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු විශාල හිඟ මුදලක් පැවති නිසාත් අදාළ සැපයුම්කරුවන් විසින් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. 2022 වර්ශයේ සිට කාර්යසාධන සුරක්ෂණය ඉදිරිපත් නොකිරිමට හේතු  කාරණා ලිඛිතව අදාල සැපයුම් කරුවන්ගෙන් ලබා ගැනීමට කටයුතු යොදා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (iv)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 8.9.3 හා 8.9 අනුව ගොවිපොළවල් සඳහා ගව ආහාර මිලදී ගැනීම හා මණ්ඩලයේ ගොවිපොළවල් සඳහා පොහොර මිලදී ගැනීම යන ප්‍රසම්පාදනයන් සිදුකිරීමේදී ලිඛිත ගිවිසුමක් පැවතිය යුතු වුවද මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේදී සත්ව ආහාර සැපයීම සහ පොහොර සැපයීම සඳහා තෝරා සැපයුම්කරුවන් සමග ලිඛිත ගිවිසුම් අත්සන් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (v)ටෙන්ඩර් කොන්දේසි අනුව සැපයුම්කරුවන්ගෙන් ලබාගත් සාම්පල් රසායනාගාර පරීක්ෂණවලට ලක්කර | 2020 වසරේ සිට සැපයුම් කරුවන් තෝරා ගැනීමේදී අදාළ සත්ව ආහාර වල සාම්පල | සාම්පල් ප්‍රමිතිය |

| | | |
|---|---|---|
| ප්‍රමිතිය තහවුරු කර ගැනීමෙන් පසුව මිලදී ගැනීම් සිදුකළ යුතු වුවද සාම්පල් ලබාගැනීමෙන් තොරව මැණික් පාලම සහ අනෙකුත් ගොවිපොළවල් 19 ට ගව ආහාර මිලදී ගෙන තිබුණි. | රසායනාගාර පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව තාක්ෂණික ඇගයීම් කමිටුව හරහා සිදු කරනු ලබන ක්‍රියාවලිය තුලින් තෝරා ගැනීම් සිදු කර ඇත. | තහවුරු කර ගැනීමෙන් පසුව මිලදී ගැනීම් සිදුකළ යුතුය. |
| (vi) මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් 2018 නොවැම්බර් 08 වන දින ටෙන්ඩර් කැඳවීමකින් හා සාම්පල් පරීක්ෂාවකින් තොරව රිදියාගම ගොවිපොළ සඳහා 2018 නොවැම්බර් 14 සිට 2019 ජනවාරි 01 වන දින දක්වා ගව ආහාර මෙට්‍රික් ටොන් 834.5ක් රු.53,063,164ක ඉන්වොයිස් මිලකට ජාඇල ප්‍රදේශයේ පුද්ගලික සමාගමකින් මිලදී ගෙන ගෙවීමට කටයුතු කර තිබුණි. | රිදියගම ගොවිපල වෙත ගව ආහාර ( Type 01 ) මිල දී ගැනීම සඳහා කැඳවන ලද ටෙන්ඩරය සඳහා මහවැලි ෆීඩ් මිල්ස් ආයතනය විසින් ලංසු ඉදිරිපත් කර තිබූ බැවින් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත නැවත ටෙන්ඩර කැඳවීමකින් තොරව මහවැලි ෆීඩ් මිල්ස් ආයතනය වෙත 2018 නොවැම්බර් මස 08 වන දින සිට 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා රිදියගම ගොවිපල වෙත ගව ආහාර ටෙන්ඩරය පිරිනැමීම සිදු කර ඇත . | ටෙන්ඩර් කැඳවීමකින් හා සාම්පල් පරීක්ෂාවකි පසුව මිලදී ගැනීම් සිදුකළ යුතුය. |
| (vii) රිදියාගම ගොවිපොළට ගව ආහාර මිලදී ගැනීමේදී නිලධාරීන් තිදෙනෙකුගෙන් යුතු කමිටුවක් විසින් ලංසු විවෘත කිරීම පිළිබඳ වාර්තා සටහනක් තබා තිබුණ ද එම වාර්තාවට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව වැට් සහිත හා රහිත ලංසු මිල, ලංසු සුරක්ෂණ මුදල සහ එය තිබෙන බැංකුව යන මූල්‍යමය තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය අනුව අ, ආ, ඇ, යටතේ ඇතුළත් විය යුතු මූල්‍යමය තොරතුරු ඇතුළත් කිරිමට කටයුතු යොදා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ)ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය යටතේ වන ගොවිපොළවල් හා අනෙකුත් සමාගම් සතු කුකුළු ආහාර සකස් කිරීමේ ,ඇඹරීමේ හා මිශ්‍රණ කිරීමේ යන්ත්‍රවලින් සහ සත්ත්ව ආහාර වලට අවශ්‍ය බඩ ඉරිඟු, සෝයා වැනි භෝග වගා කර ඇති ඉඩම් වලින් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ නව දැනුම උපයෝගී කරගනිමින් තත්ත්වයෙන් උසස් සත්ත්ව ආහාර නිෂ්පාදනයෙන් සත්ත්ව ආහාර වියදම අවම කර ගැනීමටත් ,ගොවිපොළවල් ලාභදායිත්වය ඉහළ නැංවීමටත් කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට අභිජනන කුකුළු ගොවිපලවල්, සූකර ව්‍යාපෘති සඳහා අවශ්‍ය සත්ත්ව ආහාර මණ්ඩලයේ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර තුලින් නිෂ්පාදනය කිරිමට කටයුතු යොදා ඇත. | මණ්ඩලය සතු කුකුළු ආහාර සකස් කිරීමේ ඇඹරීමේ හා මිශ්‍රණ කිරීමේ යන්ත්‍රවලින් නිෂ්පාදනය කිරිමට කටයුතු යොදා ගත යුතුය. |